# දරුවන් සහ සිනමාව

දරුවන් සමඟ සිනමාපටයක් නැරඹීමට යෑම ඇතැම් විට ඔබට කාලෙකින් සිදුකරන්නට බැරි වුණ දෙයක් වෙන්න ඇති. අප ගෙවන අතිශය කාර්යය බහුල ජීවිතය සමඟ එවැනි දෙයකට කාලය සොයා ගැනීම එක්තරා අසීරු කරුණක් වන්නට පුළුවන්. නමුත් දරුවන,' සිනමාව සමඟ යහපත් සබඳතාවයක් පවත්වා ගෙන යෑම ඉතාම වැදගත් කරුණක් ලෙස මම දකිමි.. පුළුල් තිරයෙන් දරුවා දකින ආශ්චර්යයමත් ලෝකය ළමා මනස වෙත කරන සියුම් බලපෑම සුවිශාල වන්නට පුළුවන්. එනිසා දරුවන් විසින් පරිශීනය කරනු ලබන සිනමාව කෙබඳුද යන්න පිළිබඳව අප තුල මනා වැටහීමක් තිබිය යුතුය යන්න මගේ විශ්වාසයයි.

නිර්වර්ණ
උපේක්ෂා සේනානායක
COLOURLESS

වර්ථමානයේ වඩාත් ජනප්‍රිය වන්නේ වෝල්ට් ඩිස්නි ඇනිමේෂන් සමාගම විසින් නිෂ් පාදනය කර බෙදාහරින සිනමාපටයි. මෑත ඉතිහාසයේ වඩාත් ජනප්‍රිය වූ ෆ්‍රෝසන්, ෆයින්ඩින් ඩෝරි සහ ෆයින්ඩින් නීමෝ වැනි සිනමාපට වලින් වඩාත් කථාබහට ලක්වූයේ පවුල සහ සහෝදරත්වය යන සංකල්පයයි. එය ඉතාම ප්‍රශංසනීය සහ සාධනීය ප්‍රවණතාවයක් ලෙස මම දකිමි. සිනමාව හුදු මායා ලෝකයක් නොවී යතාර්ථවාදී කාරණාවක් ලෙස දරුවන්ට සමීප වීම එක්තරා සාර්ථකත්වයකි.

ඉතාම මෑතකදී මා නැරඹූ "මොආනා" වෙනස් තේමාවක් පදනම් කරගත් ඩිස්නි සිනමාපටයක් විය. එය ස්වභාවධර්මය සහ මිනිස් ක්‍රියාකාරකම් අතර පවතින සහ සම්බන්ධය විචිත්‍රවත් ලෙස ඉදිරිපත් කළ චිත්‍රපටයක් විය. ස්වභාවධර්මයට එරෙහි වීමේ ප්‍රතිඵලය



කවරාකාරද යන මතය ළමා මනසට යහපත් ලෙස සම්ප්‍රේෂණය කළ හොඳ සිනමාපටයක් ලෙස මොආනා හඳුනාගත හැකිය.

මොටුනුඉ නම් පොලිනීසියානු දුපතේ ගෝත්‍ර නායකයාගේ දියණිය වූ මොආනා තම වර්ගයාගේ හිත සුව පිණිස සිය මිත්තණිය වූ ටාලාගේ දිරි ගැන්වීම මත මහාසාගරය තරණය කරමින් මෝයි නම් වූ විශ්මිත පුද්ගලයා සොයා යන වීර චාරිකාවක් ලෙස එහි

කථාව දිග හැරෙයි. විනෝදය,ත්‍රාසය සහ කුතුහලය පිරුණු චිත්‍රපටයක් වන මොආනා වෙතින් දරුවන් මෙතෙක් අත් නොවිඳි අපූරු සංස්කෘතික පරිසරයක් ඔවුන් වෙත සමීප කරයි. දුපත් වාසීන්ගේ ජනජීවිතය සහ ඔවුන්ගේ සිතුම්පැතුම් පිළිබඳ පරිපූර්ණ අවබෝධයක් දරුවන්ට ලබා දීමට චිත්‍රපටය තුලින් විශාල වෙහෙසක් දරාතිබුණි. නිතර දැක පුරුදු කොකේසියානු මුහුණු වලට වඩා වෙනස් මුහුණු සහිත දයාබර මනුෂ්‍ය වර්ගයක කථාන්දරය සංවේදී ලෙස ඉදිරිපත් කිරීමට චිත්‍රපටියේ තිරරචකයන් මෙන්ම අධ්‍යක්ෂවරුන් වන රොන් ක්ලෙමන්ට්ස් සහ ජෝන් මස්කර් දරා ඇති උත්සාහය අතිශයින් අගය කළ යුතුය.

ප්‍රංශ සහ කැනේඩියානු සම නිෂ්පාදනයක් ලෙස ඉදිරිපත් වුණු "බැලරීනා" මෑතකදී දරුවන් අතර වඩාත් ජනප්‍රිය වූ තවත් චිත්‍රපටයකි. දිළිඳු අනාථ දැරියක් පැරිස් ඔපෙරා බැලේ පාසලට ඇතුලත් වී ජීවිතය ජයගත් අන්දම මෙහි කථාබහ වන ප්‍රධාන කරුණයි. ධෛර්යය සහ අධිශ්ඨානශීලීත්වය තුලින් ජීවිතය ජයගන්නා දරුවන් ගැන අප කුඩා කළ කියවූ ඉංග්‍රීසි නවකථා වෙතින් අපේ ජීවිත වලට ලැබුණු ආලෝකය ගැන අමුතුවෙන් කිවයුතු නොවේ.

දරුවන්ගේ සිනමාව අප දකිනවාට වඩා බොහෝ සියුම්ය. එහි ස්පර්ෂ කළ යුතු ඉසව් සොයා යා යුත්තේ මහත් ප්‍රවේශමෙනි. දරුවා සිනමාව නිවැරදිව භාවිතා කරනවාද ඔහු හෝ ඇය සිනමාව තුලින් ජීවිතය වඩාත් ප්‍රගතිගාමී ලෙසින් දකිනවාද යන්නට වගවීමට තරම් ඔබ දරුවා කෙරෙහි උනන්දු වනවාද යන්න නැවත සිතාබලන්නැයි මම ඉල්ලා සිටිමි. නැතහොත් ඔබේ දරුවා සිනමාව අවභාවිත කරන්නන්ගේ ගොදුරක් වන්නට ඉඩ තිබේ.




**මහින්ද දිසානායක දිවුල්ගනේ**

බටහිර වික්ටෝරියා ශ්‍රී ලංකා බෞද්ධ සංගමය මෙවරත් බක්මහ උළෙල අවුරුදු උදානය අප්‍රේල් 02 ඉරිදා ප්‍රදේශවාසීන් සෙන්ට් ඕල්බන්ස් සිංහල භාෂා පාසලේ දෙමාපියන් දරු දැරියන් සහ විශේෂයෙන් විහාරස්ථ දායක පිරිසගේ සම්බන්ධයෙන් සහ සහයෝගයෙන් ඩියර් පාක් සසෙල්ලා පාක්හිදී උත්කර්ශවත් අයුරින් පැවැත්වීමට සංවිධානය කොට තිබේ.

සිංහල අලුත් අවුරුද්ද ශ්‍රී ලාංකික ජන ජීවිතය හා තදින් බැඳුණු සංස්කෘතික කලා මංගල්‍යයකි. පරිසරය පවා අමුතුම ප්‍රබෝධයකින් ඇළලී ගිය ගස්වල කොල හැලී මල් පීදුණු වසන්ත සමයකි. විශේෂයෙන් එරබදුමල් වැට දිගට පිපී කොවුල් ගීතය ඇසෙන්නේ මේ බක්මාසය ලබන්නත් පෙර සිට ය. හැම ගමකම පාහේ ගෙවල් හුණු පිරියම් කර ගොම මැටි ගා අස්වැන්න නෙළාගෙන අටුකොටු පුරවාගෙන සතුටින් කල් යවන සමයයි අවුරුදු කාලය.

අවුරුද්ද යනු චාරිත්‍ර වාරිත්‍ර විධි හා බැඳුණු සිංහල සංස්කෘතික උත්සවයක් ලෙස හැඳින්විය හැකි ය. ඒ හා සමගාමීව එක්ව ඇති ජාතික ක්‍රීඩා ද මෙම සංස්කෘතික උත්සවයේදී ප්‍රමුඛත්වයක් ගනියි. මේ නිසා ශ්‍රී ලාංකික වූ ජන ජීවිතය සංස්කෘතික වූ වටිනාකම් ඇති දෙගුරුන් වැඩිහිටියන් ගරු කරන චාරිත්‍ර වාරිත්‍ර මගින් හික්මුණු ආගම ධර්මයට අනුව කටයුතු කරන පිරිසක් වේ. එදා සිට අද දක්වා නොකඩවා පවත්වාගෙන එන මෙම සංස්කෘතික අගයන් අදද උසස් ලෙස ගරු කරමින් පැවැත්වීම වැදගත් වේ.

පසුගිය වසරේ මෙන්ම මෙවරද බටහිර වික්ටෝරියා ශ්‍රී ලාංකික බෞද්ධ සංගමය සෙන්ට් ඔල්බන්ස් සිංහල භාෂා පාසල සමග එක්ව සංවිදානය කරන සිංහල අවුරුද් උත්සවය - අවුරුදු උදානය - 16 වැනි වරටත් උත්කර්ශවත් අයුරින් පැවැත්වීමට සූදානම් කර තිබේ. දරුවන්ට අවුරුදු උත්සවයේදී සතුටු වීමට පමණක් නොව අපේ චාරිත්‍ර වාරිත්‍ර හා ජන ක්‍රීඩා පිළිබඳ දැණුමක්ද යහලු මිත්‍රයන් හමු වී සුහදතාව වර්ධනය කර ගැනීමට මහඟු අවස්ථාවක් ලැබෙයි. දරුවන්ට පමණක් නොව වැඩිහිටි සියලු දෙනාටද තම මව් බිමේ අවුරුදු සිරිය භුක්ති විඳිනවා මෙන් මෙහිදීද තම හිතවතුන් සමග මේ බක්මහ සැණකෙළිය විඳගත හැකි ය.

තරග වලට සහභාගිවීමෙන් ජය ගැනීම පමණක් නොව ජය පරාජය ජීවිතයේ විඳ ගැනීමට පුරුදුකරන්නේ දරුවන්ට පමණක් නොව සියලු දෙනාටමය. එකතුව සමගිව කටයුතු කිරීමේ වටිනාකම ඉගෙන ගන්නවා පමණක් නොව එකිනෙකාට ගරු කිරීමට ද අධ්‍යයනයක් ලබයි. විවිධ ශ්‍රී ලාංකික ආහාර වර්ගවල රස විඳීමටද මෙහිදී අවස්ථාව ලැබෙයි. මෙම උත්සවය සංවිධානය කිරීමේදී ගෞරවණීය ශාස්ත්‍රපති පල්ලේවෙල දේවරක්ඛිත විහාරාධිපති හාමුදුරුවන්ගේ හා විහාරවාසී හාමුදුරුවන් වහන්සේලා ගේ අනුශා සකත්වයත් සිංහල භාෂා පාසලේ සංවිධායකවරුන් වන චන්ද්‍රසිරි වීරසිංහ හා මිල්කින් බණ්ඩා රනායක යන මහතුන් දෙපළගේ නොමඳ උත්සාහයත් බෞද්ධ සංගමයේ සභාපතිතුමා ඇතුලු සියලු දෙනාගේ කැපවීමත් මෙහිදී සිහිපත් කළ යුතු අතර සිංහල පාසලේ දෙමාපියන්ගේප දැඩි කැපවීමත් අගය කළ යුතුය.

මෙවරද ඩියර්පාක් සසෙල්ලා ක්‍රීඩාගණයේදී මෙම උත්සවය උදේ 9 සිට සවස්වන තුරු පැවැත්වීමට කටයුතු කර ඇති අතර මෙහිදී සිහිපත් කළ යුත්තේ වාහන නවතා තැබීමේ පහසුකම් ඉතා හොඳින් මේ ස්තානයේ ඇති බවයි. වෙනදා මෙන් වෙළඳ ප්‍රදර්ශණ කුටි ඔබට අවට ප්‍රදේශයේ ඔබට අවශ්‍ය දේ ගැන තොරතුරු ලබා ගැනීමේ පහසුව සැලසෙන අතර උදේ 9 ට ඇරඹෙන කෑම මේසයෙන් කිරිබත් කැවුම් කොකිස් අළුවා ආදී අවුරුදු කෑම අනුභවකොට අවුරුදු උත්සවය මේ සංස්කෘතික උළෙල ආරම්භ කිරීමට හැකිවෙන අතර ශ්‍රී ලංකාවේ ඔබ හිඳිනවා වැනි හැඟීමක් ඔබට ඇතිවේ. ඔබට දරුවන්ට අසල්වාසීන්ට කෑම මේසයෙන් පසු පහසු මිලට ගැනීමට ශ්‍රී ලාංකික ආහාරද සපයා තිබීම ඉතාම වැදගත් වේ.

පසුගිය වසරේ මෙන්ම මෙවරද තරග රාශියක් විශේෂයෙන් දරුවන්ටත් අනෙකුත් වැඩිහිටි සියලු දෙනාටත් සංවිධානය කොට තිබීම තෑගි රාශියක් දිනා ගැනීමේ අවස්ථාව උදාකරගත හැකි අතර උසස් විනෝදයක්ද ඔබට විඳගැනීමට හැකිවීම වැදගත්වේ. බැලුන් පිපිරවීම බනිස්කෑම අලියාට ඇස තැබීම වැනි තරග වලට දරුවන් දැඩි ඇල්මක් දක්වන බව අපි දන්නා කරුණක් වන අතර රබන් ගැසීම කඹ ඇදීම පොල් ගෑම මෙම ක්‍රීඩා වැඩිහිටියන් දෙමාපියන් කැමති ක්‍රීඩාවන්ය. මේ හැමට සහභාගිවී රස විඳිය හැකිය. එදින ඔබ ගෙදර යන්නේ තෑගි අරගෙන සතුටත් හිතේ දරාගෙන ය.

වෙනදා මෙන් මෙවරත් අසල්වාසීන් රැගෙන යහලු මිත්‍රයන් දැණුවත්කර විවිධ ජාතීන් සමග උදෙන්ම ප්‍රදේශවාසී ඔබ හැමදෙනා පැමිණෙන ලෙස ආරාධනා කරන්නේ ආදරයෙන් ගෙරවයෙන්. වසර 207 අප්‍රේල් 02 ඉරිදා උදේ 9ට පෙර ඩියර්පාක් සසෙල්ලාපාක් පිටියට පැමිණෙන්න

විමසීම්
වීරසිහ - 0402 310 091
මිල්කින් - 0425 855 621